**බළන්ගොඩ නගර සභාව**

**2022-01-21 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.01.21**

**වේලාව - පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ජී.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ජී.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රිනී | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |

**නිලධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ජී. කරුණාරත්න මිය |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කළ අතර, නොවැළැක්විය හැකි හේතුවක් නිසා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අද දින විශේෂ සභාවට නොපැමිණෙන බව දන්වා ඇති බව ද පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය සඳහා කැඳවන ලද ටෙන්ඩර්පත් විවෘත කිරීම හා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම මෙන්ම බළන්ගොඩ තානායම ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව ද පවසන ලදී.

**01. පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය සඳහා කැඳවන ලද ටෙන්ඩර්පත් විවෘත කිරීම හා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම**

ඒ අනුව පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය සඳහා කැඳවන ලද ටෙන්ඩර්පත් විවෘත කිරීම හා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණය ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය සඳහා ටෙන්ඩර් පත් 01 ක් නිකුත් කර තිබූ අතර, එම ලංසුපත ලැබී තිබුණි. එහි දී මොහොමඩ් රියාල් මරික්කාර් අන්වර්ධීන් යන අය ඉදිරිපත් කර තිබූ රු. 400,042.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගත් තීරණය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**02. බළන්ගොඩ තානායම ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම**

අනතුරුව ගරු සභාපතිතුමන් විසින් බළන්ගොඩ තානායමේ ටෙන්ඩර් කාලය 2022-02-28 දිනෙන් අවසන් වන බැවින් තානායම ටෙන්ඩර් කිරීම සම්බන්ධව තීරණයක් ගත යුතු බව පවසන ලදී. එමෙන්ම තානායමේ වර්තමාන බදුකරු වන ඉන්දික එරික් සිසිල් යන අය ගරු සභාවට ඉදිරිපත් කරන්නට යෙදුණු ඉල්ලීම පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කරන ලදුව ඒ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව බදුකරුට කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂයේ මාර්තු මස කුලී මුදලින් 50% ක්, අප්‍රේල් මස සම්පූර්ණ කුලිය, ඔක්තෝම්බර් මස කුලියෙන් 50% ක් ලෙස කපා හැර ඇති අතර, තවද 2021 වර්ෂයේ ජූලි මස කුලියෙන් 50% ක්, අගෝස්තු මස කුලියෙන් 50% ක්, සැප්තැම්බර් හා ඔක්තොම්බර් මස කුලිය සම්පූර්ණයෙන් කපා හැරීමට ආණ්ඩුකාරතුමා වෙත නිර්දේශ සහිතව ඉදිරිපත් කර ඇති බැවින් කොරෝනා වසංගත තත්ත්වය තුල වර්තමාන බදුකරුගේ ව්‍යාපාරික පාඩුව අවම වී ඇති බව යන කරුණු අනාවරණය වී ඇති බව ද පළාත් පාලන ආයතනවල දේපල බදු දීම විධිමත් කිරීමට අදාලව නිකුත් කර ඇති ප.පා.කො 03/2020

චක්‍රලේඛය අනුව දේපල සඳහා වසර 03කට වරක් හෝ උපරිම වසර 05කට වරක් රජයේ තක්සේරුවක් සිදු කළ යුතු බව ද 2022-02-28 දිනට මෙම දේපල බදු දී වසර 05 ක් ඉකුත් වන බැවින් නව තක්සේරුවක් මත ලංසු කැඳවීම කළ යුතු බව ද එම නිසා නව තක්සේරුවක් ලබාගෙන 2022 වර්ෂයේ සිට ඉදිරියට නැවත ලංසු මඟින් බදුකරුවෙකු තෝරා ගැනීම කළ යුතු බව එම ලිපිය මඟින් දන්වා ඇති බව ද පැවසීය.

මෙහි දී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා, පසුගිය සභාවක දී විවාහ උත්සව සඳහා ලබා ගත් අත්තිකාරම් නැවත ගෙවීමට නොහැකි නිසා එම උත්සවයන් පැවැත්වීම සඳහා ඉල්ලීමක් කර තිබූ බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් තානායමේ ටෙන්ඩර්කරු වන එරික් සිසිල් යන අය ටෙන්ඩර් කාලය දීර්ඝ කර දෙන ලෙස ලිපියක් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති අතර, එම ලිපියට පිළිතුරු ලැබෙන තුරු තීරණයක් නොගෙන සිටිය හැකි නේදැයි විමසීය.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, ටෙන්ඩර් කිරීමට අදාල පුවත්පත් දැන්වීම ටෙන්ඩර් කාලය අවසන් වීමට දින 21 කට පෙර පළ කළ යුතු බැවින් ජනවාරි මස 31 දිනට පෙර ගරු ආණ්ඩුකාරතුමා විසින් එරික් සිසිල් යන අයටම ලබා දෙන ලෙස නිර්දේශ කර ලිපියක් ලබා නොදුනහොත් තානායම ටෙන්ඩර් කිරීමට සිදු වන බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පැවසුවේ ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලිපිය ලබා ගැනීමට නොහැකි වුවහොත් ටෙන්ඩර් කරන ලෙසයි.

ඒ අනුව 2022 ජනවාරි මස 31 දිනට පෙර ගරු ආණ්ඩුකාරතුමා විසින් එරික් සිසිල් යන අයටම ලබා දෙන ලෙස නිර්දේශ කර ලිපියක් ලබා නොදුනහොත් තානායම ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

අනතුරුව අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 10.50 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

එම්.ටී.එම්. රුමි,
සභාපති(වැ/බ),
බළන්ගොඩ නගර සභාව.